| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022/01/26 |

පැමිණිලි පාර්ශවය : එස්.ඒ.රේණුකා මිය.
අංක 44/249, කිරුළ ව්‍යාපාරය,
කිරුළපන, කොළඹ 08.

වගඋත්තර පාර්ශවය : ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
බොරැල්ල.

**පැමිණිලි අංකය : *HRC/830/17***

**පැමිණිල්ල :**

ඉහත පැමිණිලිකාරිය මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් කරමින් සඳහන් කර සිටින්නේ, අවුරුදු 15 ක් වයසැති තම පුතා වන යූ.කේ.දමිත් සිල්වා යන පාසැල් සිසුවා වගඋත්තරකරුවන් විසින් 2017.03.02 වන දින අත්අඩංගුවට ගෙන පහරදී ඇති බවත්, ඒ තුළින් එම දරුවාගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවත්ය.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :**

පැමිණිල්ලට අදාළව 2017.04.03 දින පැවති පරීක්ෂණය සඳහා වගඋත්තර පාර්ශවය වෙනුවෙන් උ.පො.ප. ලක්ෂාන් මහතා කොමිෂන් සභාව ඉදිරියේ පෙනීසිටිමින් ප්‍රකාශ කර සිටින්නේ, 2017.03.02 වන දින හෙරොයින් ලග තබා ගැනීම යටතේ පුද්ගලයින් දෙදෙනෙක් අත්අඩංගුවට ගත් බවත්, ඔවුන් පතිරණලාගේ ගිහාන් ආසිරි සහ කුරුප්පුගේ ප්‍රදීප් සිල්වා කුමාර නොහොත් ප්‍රියන්ත යන අය බවත්, එම අයවළුන් අත්අඩංගුවට ගෙන ප්‍රශ්ණ කිරීමේදී එම හෙරොයින් කුඹි කැලේ සනා යන අයගේ බවට ප්‍රකාශ කළ බවත්, කුඹි කැලේ ගෙදර යන ස්ථානයේ සනා යන අය සිටින බවට තොරතුරු හෙළි කිරීමෙන් අනතුරුව එම සැකකරුවන් සමග සනා යන අයගේ නිවසට ගිය බවත්, එම නිවසට යනවිට අවුරුදු 15 ක පමණ පිරිමි ළමයෙක් නිවසේ සිටි බවත්, ඔහුට තමන් පොලිසියෙන් බවට පහදා දී හැඳුනුම්පත ද ඉදිරිපත් කළ බවත්, එම අයගෙන් සනා යනු කව්දැයි කියා විමසූ විට සනා යනු ඔහුගේ තාත්තා යැයි පැවසූ බවත්, තාත්තා කොහේදැයි විමසූ විට ගෙදර නැති බවට ප්‍රකාශ කළ බවත්ය. පසුව නිවස පරීක්ෂා කිරීමේදී නිවස තුළ තිබී රෝස පාට ග්‍රොසරි කවරයක් තුළ බහා තිබූ හෙරොයින් පැකට් තුනක් සොයාගත් බවත්, පසුව එම දරුවාට ඇඳුමක් ඇද ගන්නා ලෙසට පැවසූ බවත්, අසල නිවසේ සිටින ඔහුගේ නැන්දාට දරුවා පොලිසියට රැගෙන යන බවත්, ඔහුගේ අම්මාට පොලිසියට එවන ලෙසට දැන්වූ බවත්, පසුව දරුවා පොලිසියට රැගෙන ආ බවත්ය.

පසුව ඔහුගේ අම්මා පොලිස් ස්ථානයට පැමිණි බවත්, ඒ බව දුටු එම දරුවා ඔහුගේ අම්මා ලගට ගිය බවත් සඳහන් කරයි. ඒ සමගම මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරින් දෙදෙනෙකු පොලිස් ස්ථානයට පැමිණි බවත්, පසුව මවගෙන් සහ දරුවාගෙන් ප්‍රකාශ සටහන් කරගෙන මුදාහැරිය බවත්, මෙම දරුවාට කිසිදු පහරදීමක් නොකළ බවත්, ඔහුව අත්අඩංගුවට ගැනීමක් නොකළ බවත්, ඔහුට කිසිදු තර්ජනයක් නොකළ බවත් වගඋත්තර පාර්ශවය වෙනුවෙන් වැඩිදුරටත් සඳහන් කර ඇත.




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541 / 74 | ඊමේල් / மின்னஞ்சல் / E-mail | sechrc@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

**නිරීක්ෂණ** :

පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාවේ නිලධාරීන් දෙදෙනෙකු පොලිස් ස්ථානය පරීක්ෂා කර ඇති අතර, එම අවස්ථාවේදී පැමිණිලිකාරියගේ පුතා වන යූ.කේ.දමිත් සිල්වා නැමති දරුවා වගඋත්තරකරුවන්ගේ භාරයේ සිටි බව නිරීක්ෂණය වේ.

ඉහත සඳහන් දරුවාගෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාව වෙත කැඳවා ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති අතර, එම ප්‍රකාශයේදී ඔහුට වගඋත්තරකාර පාර්ශවය විසින් පහරදීමක් සිදු නොකළ බවට ප්‍රකාශ කර ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය නැවත කොමිෂන් සභාව වෙත පැමිණ පුතාට පහරදුන් බවට දැනුම්දීමෙන් අනතුරුව අධිකරණ වෛද්‍ය පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කර ඇති නමුත්, ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කර නොමැති බව ද නිරීක්ෂණය වේ.

**නිගමනය** :

වගඋත්තර පාර්ශවය විසින් යූ.කේ.දමිත් සිල්වා යන දරුවාව පොලිසිය භාරයේ රඳවාගෙන සිටි බවට තහවුරු වී ඇති අතර, යම් පුද්ගලයෙකුගේ නිදහස ඇහිරීම ද අත්අඩංගුවට ගැනීමක් බවට නීතිය මගින් නිර්වචනය කර ඇති බැවින්, මෙසේ රඳවා තබා ගැනීම අත්අඩංගුවට ගැනීමක් බවත්, එසේම එය නීතියෙන් නියම කර ඇති ආකාරයට සිදුකර නොමැති බැවින්, මෙම දරුවාගේ 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති 13(1) සහ 13(2) යන ව්‍යවස්ථාවන් හි සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරමි.

තවද, <u>**SC FR 672/12 ඉෂාරා අංජලී එරෙහිව වර්ණ බෝගහවත්ත**</u> නඩුවේදී නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් මානව ගරුත්වයට ගරු කිරීම හා ආරක්ෂා කිරීම සහ සියළු පුද්ගලයන්ගේ මානව හිමිකම් පවත්වාගෙනයාමට සහ ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු බවත්, එසේම එම නිලධාරීන් නිත්‍යානුකූලභාවයෙන් කටයුතු කළ යුතු අතර, ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුව කටයුතු කළ යුතු බවත්, විශේෂයෙන්ම බාල වයස්කරුවන්, රෝගීන්, මහළු අය සහ වෙනත් විශේෂ තත්ත්වයක් සහ අවශ්‍යතාවයක් ඇති අයවළුන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතු බවත්, අදාළ මානව හිමිකම් තත්වයන් කඩ නොවන ලෙසට කටයුතු කළ යුතු බවත් දක්වා ඇත.

එසේම, ළමයෙකු රඳවා තබා ගැනීම හෝ සිර ගත කිරීම අවසාන පියවර සහ උපරිම දඬුවමක් වන බවට අධිකරණය සලකන බව ද, රඳවා තබා ගැනීම ඉතා කෙටි කාලයක් සඳහා විය යුතු බවට ද අධිකරණය තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට අනුව ළමයෙකු අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම ඔහුට හෝ ඇයට කරන බරපතල මූලික අයිතිවාසිකම් කඩවීමක් බවට තීරණය කර ඇති බව ද පෙන්වා දෙමි.

**නිර්දේශය** :

01. මෙම අත්අඩංගුවට ගත් දරුවා කොළඹ ඩී.එස්.සේනානායක විද්‍යාලයේ 10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන දරුවෙක් බවත්, මෙම අත්අඩංගුවට ගැනීම නීති විරෝධී අත්අඩංගුවට ගැනීමක් බවත්, එමනිසා ඔහුගේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර ඇති 13(1) සහ 13(2) ව්‍යවස්ථාවන් හි සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බැවින්, එවකට සේවයේ නියුතුව සිටි වගඋත්තර පාර්ශවය විසින් දරුවා වෙත රු. ලක්ෂයක මුදලක් ගෙවීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරමි.

02. එසේම, මෙම අත්අඩංගුවට ගැනීම සිදුකල වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් සුදුසු විනයානුකූල පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති සහ නීතිපති වෙත ද යොමු කරනු ලැබේ.

2022.02.25 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
(හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු),
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

A. Shanmuganath
අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

පිටපත් 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

02. නීතිපති,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

03. අධ්‍යක්ෂ,
මානව හිමිකම් කොට්ඨාශය,
අංක 7, 7 වන මහල,
එන්.එම්.පෙරේරා මාවත, කොළඹ 08.
(අදාළ වගඋත්තරකරුගේ වර්තමාන සේවා ස්ථානය වෙත මෙහි මුල් පිටපත යොමු කිරීම සඳහා))

සැ.යු. :- අදාළ මුදල 'මුදල් ඇණවුමක්' මගින් පැමිණිලි පාර්ශවය වෙත යවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

සා/